**රචනා ප්‍රශ්න**

5. *(a)* පසෙහි ප්‍රධාන රසායනික ලක්ෂණ 2ක් නම් කර හා ඒවායේ වැදගත්කම විස්තර කරන්න.

*(b)* ද්විරෝද ට්‍රැක්ටරයකට හෝ සිව්රෝද ට්‍රැක්ටරයකට සවි කළ හැකි ප්‍රාථමික බිම් සැකසීමේ උපකරණ නම් කර එම උපකරණ පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

*(c)* ආරක්ෂිත ගෘහයක් තුළ ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණයේ වාසි විස්තර කරන්න.

6. *(a)* ආහාර නරක් වීමට හේතුවන ක්ෂුද්‍ර ජීවීන්ගේ වර්ධනය කෙරෙහි බලපාන බාහිර හා අභ්‍යන්තර සාධක විස්තර කරන්න.

*(b)* කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන තුළ උපකරණ පිරිසිදු කිරීමේ CIP - (Clean - In -Place) යාන්ත්‍රණය ගැලීම් සටහනක් ඇසුරින් විස්තර කරන්න.

*(c)* තල මෙස මිනිතයේ දී අන්තර්ඡේදන ක්‍රමය ඇසුරින් ඉඩමක සිතියමක් නිර්මාණය කරන ආකාරය රූප සටහනක් ඇසුරින් විස්තර කරන්න.

7. *(a)* ශ්‍රී ලංකාවේ ප්‍රධාන වැවිලි බෝගයක් වන තේ බෝගයෙන් කළු තේ (Black Tea) නිෂ්පාදනය කරනු ලබන ආකාරය, තේ නෙළීමේ සිට ඇසිරීම දක්වා පියවර විස්තර කරන්න.

*(b)* විසිතුරු මසුන් හඳුන්වා දීම සඳහා විසිතුරු මත්ස්‍ය ටැංකියක් සූදානම් කරන ආකාරය හා මසුන් හඳුන්වා දීම සිදු කරන ආකාරය විස්තර කරන්න.

*(c)* වර්තමාන ලෝකයේ හමුවන විවිධ වෘත්තීන්වලදී සිදුවන ආපදා හේතුවෙන් වෘත්තිකයාට, ආයතනයට හා රටට සිදුවන අහිතකර බලපෑම් විස්තර කරන්න.

8. *(a)* නව ආහාර නිෂ්පාදනයක් වෙළෙඳපොළට හඳුන්වා දීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාවලියේ මූලික පියවර විස්තර කරන්න.

*(b)* රටක සංවර්ධනය කෙරෙහි ව්‍යවසායකත්වය වැදගත් වන ආකාරය විස්තර කරන්න.

*(c)* එළවළු හා පලතුරුවල පසු අස්වනු හානිය සිදු විය හැකි අවස්ථා සහ එම අවස්ථාවන්හිදී ඒවා අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග විස්තර කරන්න.

9. *(a)* ගැඹුරු පෝෂණ ධාරා තාක්ෂණය (Deep Flow Technique –DFT) සහිත ජලගත වගා පද්ධතියක් ඉදිකිරීමේ දී හා පවත්වා ගෙන යාමේ දී ඇතිවන සීමාකාරී තත්ත්ව හා ඒවා වළක්වා ගැනීමට යෙදිය හැකි උපාය මාර්ග විස්තර කරන්න.

*(b)* සාර්ථක ජීව වායු නිෂ්පාදනයක් උදෙසා, ජීව වායු ඒකකයක පවත්වා ගත යුතු තත්ත්ව විස්තර කරන්න.

*(c)* දැව ශ්‍රේණිගත කිරීම සඳහා යොදා ගන්නා මූලික ක්‍රම හඳුන්වා, දැව ශ්‍රේණිගත කිරීමේ වැදගත්කම් පැහැදිලි කරන්න.

10. *(a)* ජලය භාවිත කිරීමේ දී එම ජලයට එකතුවන විවිධ ද්‍රව්‍ය මගින් ජලයේ තත්ත්වය වෙනස් වන අතර, එම අපජලය වර්ග කරන ආකාරය විස්තර කරන්න.

*(b)* සුවඳ විලවුන් නිෂ්පාදනය සඳහා, මල් පෙතිවලින් සගන්ධ තෙල් නිස්සාරණය කරන ක්‍රමවේදය විස්තර කරන්න.

*(c)* ප්‍රමාණ බිල්පත යන්න හඳුන්වා පහත විස්තරවලට අදාළ ව බිල්පතක් සකස් කරන්න.

1200 $m^2$වනභූමියක භූමි අලංකරණ සැලසුමක් නිර්මාණය කිරීම සඳහා ප්‍රමාණ බිල්පතක් සැකසීමට අවශ්‍ය වියදම් දත්ත පහත දැක්වේ.

I. මූලික බිම් සැකසීම සඳහා භූමියේ 10 $m^2$කට රු. 2000/- බැගින් වැය වේ.
II. අනවශ්‍ය අංග ඉවත් කිරීමට දිනකට රු. 5000/- බැගින් දින 2ක් ගත වේ.
III. 15 $m^2$ක තෘණ පිටියක් සැකසීමට තෘණ පිඩැළි 600ක් අවශ්‍ය වන අතර, ඒකකයක මිල රු .150/කි.
IV. රෝපණ මාධ්‍යය 1 kgක් රු. 8/- බැගින් 30 kgක් මිලදී ගත යුතු ය.
V. උද්‍යාන බංකු 4ක් සඳහා වියදම රු. 2500/- කි.
VI. මෘදු අංග හා දෘඩාංග ස්ථාපනය සඳහා දිනකට රු. 2500/- බැගින් දින 10ක් ගතවේ.
VII. ඉහත සියලු මිලදී ගැනීම් ප්‍රවාහනය කිරීම සඳහා දුර 15 kmක් වන අතර ප්‍රවාහන ගාස්තුව 1 kmකට රු.70/-කි.